# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1887/20 - 2014 නොවැම්බර් මස 05 වැනි බදාදා - 2014.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (iv)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ඒ සහ 23 ඔ යන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

සුසිල් ප්‍රේමජයන්ත,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2008 ජූලි මස 09 වන දින අංක 1557/14 දරනඅති විශේෂ ගැසට් පත්‍රයේපළ කරන ලද නියෝගවලින් සංශෝධිත, 2003 ජූනි මස 30 වන දින අංක 1295/11 දරනඅති විශේෂ ගැසට් පත්‍රයේළ කරන ලද 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 4 වන නියෝගයේ (1) සහ (2) ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-

" 4. (1) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ නියෝගවල කාර්ය සඳහා වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයකට, මෝටර් වාහන වායු විමෝචන මට්ටම පරීක්ෂා කර සහතික කිරීම සඳහා, පිළිගත් වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීමට බලය ලබා දිය යුතු ය ත

(2) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23අ වගන්තිය යටතේ ලබාගත් වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නොමැතිව කිසිම පුද්ගලයකු වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක නොකළ යුතු ය."ත

1A - G 2239 " 5000 (2014/11)
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(2) එහි පළමුවන උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

**පළමුවන උපලේඛනය**

(අ) පෙට්‍රල් වාහන

| වාහන වර්ගය | විමෝචන ප්‍රමිති | | වෙනත් කරුණු |
|---|---|---|---|
| | කාබන් මොනොක්සයිඩ් CO ( % v/v) | හයිඩ්‍රොකාබන් HC (ppm v/v) | |
| මෝටර් බයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් හැර වෙනත් පෙට්‍රල් වාහන | 3.0 | 1000 | පණගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |
| පෙට්‍රල් මෝටර් සයිකල් | 4.0 | 6000 | පණගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |
| පෙට්‍රල් මෝටර් ට්‍රයිසිකල් | 4.0 | 6000 | පණගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |

සංක්ෂිප්ත ලකුණු
( %v/v) - පරිමාව අනුව ප්‍රතිශතය
(ppm v/v) - පරිමාව අනුව මිලියනයකට කොටස්
RPM - මිනිත්තුවකට වට

(ආ) ඩීසල් වාහන

| වාහන වර්ගය | විමෝචන ප්‍රමිතිය ධූම පාරාන්ධතාවය $K$ සාධකය ($m^{-1}$) | වෙනත් කරුණු |
|---|---|---|
| ඩීසල් වාහන | 4.0 | ක්ෂණික ත්වරණයේ දී |

සංක්ෂිප්ත ලකුණු
K සාධකය - අවශෝෂක සංගුණකය
ක්ෂණික ත්වරණය - SAE RECOMMENDED PRACTICE J 1667 යන යෙදුමෙහි අර්ථකථනයෙහි ඇති අර්ථයම ඇත.

11 - 560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.